**ශීර්ෂය 241- රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව**

---------------------------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

-----------------

**1.1 මතය**

--------

ශීර්ෂය 241 - රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබදව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 ජූනි 08 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 ජූලි 11 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ .

**1.2 මතය සඳහා පදනම**

---------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකිම**

----------------------------------------------------------------------------------------------------

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරිම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් සිදු කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

**2. මූල්‍ය සමාලෝචනය**

---

**2.1 ආදායම් කළමනාකරණය**

---

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මූල්‍ය ප්‍රකාශන අනුව 2002:03:00 ආදායම් සංකේතයේ හා 2002:04:00 ආදායම් සංකේතයේ දක්වා ඇති මූලික ඇස්තමේන්තුව හා 2021 වර්ෂයේ අනුමත මූලික ඇස්තමේන්තුව අතර පිළිවෙලින් රු.මිලියන 21,603 ක හා රු.මිලියන 831 ක වෙනස්කම් පැවතුණි. | රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 01/2015 හි 03 ජේදය ප්‍රකාරව අප දෙපාර්තමේන්තුවට සත්‍ය වශයෙන් ලගාවිය හැකි 2021 වර්ෂයේ ඇස්තමේන්තු කරන ලද ආදායම් හා සත්‍ය ආදායම් ප්‍රගතිය සඳහන් කර ඇත | අනුමත අයවැය ඇස්තමේන්තුවේ සඳහන් සංඛ්‍යා මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත් කළ යුතු වීම. |
| (ආ) | 2015 ජූනි 22 දිනැති අංක 01/2015 දරන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛයේ 03 ජේදය හා මුදල් රෙගුලාසි 142 ප්‍රකාරව ආදායම් පුරෝකතනය සහ ඇස්තමේන්තු සකස් නොකිරීම නිසා පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය. | | |
| | **(I) ආදායම් සංකේතය 20:02:03:00** ලාභ | | |
| | (i) 20:02:03:00 - ලාභ ආදායම් සංකේත සඳහා 2021 වර්ෂය සඳහා රු. මිලියන 49,000 ක ආදායම් ඇස්තමේන්තු කර තිබුණත්, | 2021 වර්ෂය තුළ පැවති කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් ආයතන බොහෝමයක් අඩු ලාභදායි තත්ත්වයක් වාර්තා කළ අතර ලාභ | මු.රෙ 85 හි සඳහන් විධිවිධාන සැලකිල්ලට ගෙන නිවැරදි හා තාත්ත්වික ආදායම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | සමාලෝචිත වර්ෂයේදී එම ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 53 ක් හෙවත් රු. මිලියන 25,919 ක ආදායම් පමණක් රැස් කර තිබුණි. | ලබා ගැනීමේදී කාරක ප්‍රාග්ධන අවශ්‍යතාවයන් දැඩිව සැලකිල්ලට ගැනීම සිදු කෙරෙණි. | |
| (ii) | 2021 වර්ෂයේදී රාජ්‍ය ව්‍යවසායන් 05 ක් මඟින් රු.මිලියන 1,800 ක ආදායම් උපයා ගැනීමට ඇස්තමේන්තු කර තිබුණත්, සමාලෝචිත වර්ෂයේදී එම ව්‍යවසායන්වලින් කිසිදු ආදායමක් රැස්කර ගෙන නොතිබුණි | **ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය**<br><br>2021 වර්ෂය තුළ ක්‍රියාත්මක කිරිමට තිබූ වැඩසටහන් වලට අවශ්‍ය මූලධන අවශ්‍යතාවයන් සැලකිල්ලට ගෙන ලාභ ප්‍රේෂණය කර ගැනීමක් සිදු නොකරන ලදී.<br><br>**රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව**<br><br>සංස්ථාවේ ඇස්තමේන්තුගත ආදායම රු. මිලියන 200 කි. තථ්‍ය ආදායම රු.මිලියන 0.00 ක් විය. රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව වෙතින් වෛද්‍ය සැපයීම් අංශය වෙත ඖෂධ මිලදී ගැනීම් වෙනුවෙන් මහා භාණ්ඩාගරය විසින් ගෙවීම් සිදුකිරීමට ඇත.<br><br>**ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය**<br><br>කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් සංචාරකයන් පැමිණීම ඉතා අවම මට්ටමක පැවතුණු අතර විදේශ | මු.රෙ. 85 හි සඳහන් විධිවිධාන සැලකිල්ලට ගෙන නිවැරදි හා තාත්ත්වික ආදායම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | | රකියා සඳහා විදේශගත වීම් සිදු කිරීමද සීමා වී පැවතුණි. මේ නිසා උපයා ගැනීමට අපේක්ෂිත ඇස්තමේන්තුගත ලාභයන් ඉපයීමට නොහැකි වී තිබුණි. | |
| (iii) | සමාලෝචිත වර්ෂයේදී රාජ්‍ය ව්‍යවසායන් 05 කින් ලාභ ආදායම් ඇස්තමේන්තු කර නොතිබුණත්, එම ව්‍යවසායන්ගෙන් රු.මිලියන 6,041 ක ලාභ ආදායම් රැස්කර ගෙන තිබුණි. | 2021 වර්ෂය අගභාගය වන විට උච්චව පැනනැගුණු රජයේ ප්‍රාග්ධන ගැටළුව හේතුවෙන් ඉහත ආයතනවල විවිධ වැඩසටහන් වෙනුවෙන් වෙන් කර තිබූ මුදල් ප්‍රවාහයන්ගෙන් ලාභ ප්‍රේෂණය කර ගැනීම සිදු කරන ලදී | මු.රෙ. 85 හි සඳහන් විධිවිධාන සැලකිල්ලට ගෙන නිවැරදි හා තාත්ත්වික ආදායම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වීම. |
| (iv) | රාජ්‍ය ව්‍යවසායන් 06 ක් විසින් පසුගිය වර්ෂ 03කට අධික කාලයක සිට ලාභ ආදායම් ලෙස කිසිදු දායකත්වයක් ලබාදී නොතිබුණි. | **රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව**<br><br>2020 නිකුත් කරන ලද බාසල් 111(Basel 111) නියාමන අවශ්‍යතාවයන් අනුව මහ බැංකු විසින් පනවන ලද අවම ප්‍රාග්ධන අවශ්‍යතාවය අදාළ බැංකුව විසින් සපුරාලන තෙක් කිසිදු ලාභාංශයක් ප්‍රකාශ කිරීම අත්හිටුවා ඇත.<br><br>**රාජ්‍ය ඖෂධ සංස්ථාව**<br><br>දැඩිව පැනනැගුණු කාරක ප්‍රාග්ධන ගැටළුව හේතුවෙන් ලාභ ප්‍රේෂණය කර ගැනීම සිදු නොකරන ලදී. | රාජ්‍ය ව්‍යවසායවලින් ලාභ ආදායම් රැස්කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | | **ලංකා විදුලිබල මණ්ඩලය**<br>ලංකා විදුලිබල මණ්ඩලයේ පිරිවැය පිළිබිඹු මිල ක්‍රමයක් නොමැති වීම හේතුවෙන් දිගින් දිගටම පාඩු ලබන ආයතනයකි. ඒ අනුව 2021/12/31 වන විට ලංකා විදුලි බල මණ්ඩලයේ සමුච්චිත අලාභය රුපියල් බිලියන 189 ක් වේ.<br>**Post Graduate Institute of Management**<br>පවතින කාරක ප්‍රාග්ධන ගැටළු සැලකිල්ලට ගෙන ලාභ ප්‍රේෂණය කරගැනිමක් සිදු නොකරන ලදී.<br>**ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව/ ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව**<br>මෙම ආයතන වල වැටුප් හා සෙසු පුනරාවර්තන වියදම් පියවා ගැනීම සඳහා දිගින් දිගටම මහා භාණ්ඩාගාරයෙන් ප්‍රතිපාදන ලබාදුන් අතර පවතින කාරක ප්‍රාග්ධන ගැටළු හේතුවෙන් ලාභ ප්‍රේෂණය කර ගැනීමක් සිදු නොකරන ලදී. | |
| (v) | රාජ්‍ය ව්‍යවසායන් 04 කින් ලාභ ආදායම් ඇස්තමේන්තු කර තිබුණත්, එම ව්‍යවසායන් විසින් ඇස්තමේන්තු කළ ලාභ ආදායමට වඩා | 2021 වර්ෂය අගභාගය වන විට උච්චව පැනනැගුණු රජයේ ප්‍රාග්ධන ගැටළුව හේතුවෙන් ඉහත ආයතනවල විවිධ | මු.රෙ. 85 හි සඳහන් විධිවිධාන සැලකිල්ලට ගෙන නිවැරදි හා තාත්ත්වික ආදායම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | වැඩියෙන් සියයට 84 ක සිට සියයට 471 ක් දක්වා පරාසයක ප්‍රමාණයකින් ලාභ ආදායමට දායක වී තිබුණි. | වැඩසටහන් වෙනුවෙන් වෙන් කර තිබූ මුදල් ප්‍රවාහයන්ගෙන් ලාභ ප්‍රේෂණය කර ගැනීම සිදු කරන ලදී. | |
| **(II)** | **ආදායම් සංකේතය 20.02.04.00 - ලාභාංශ ආදායම** | | |
| (i) | 20:02:04:00 - ලාභාංශ ආදායම් සංකේතය සඳහා 2021 වර්ෂයේදී රු.මිලියන 6,000 ක ආදායම් ඇස්තමේන්තු කර තිබුණත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විට එම ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 78 ක් හෙවත් රු. මිලියන 4,672 ක ආදායම් පමණක් රැස්කර තිබුණි. | කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් ආයතන බොහෝමයක් අඩු ලාභදායි තත්ත්වයක් වාර්තා කළ අතර ලාභාංශ ලබාගැනීමේදී පවතින කාරක ප්‍රාග්ධන අවශ්‍යතාවයන් දැඩිව සැලකිල්ලට ගැනීම සිදු කෙරෙණි. | මු.රෙ 85 හි සඳහන් විධිවිධාන සැලකිල්ලට ගෙන නිවැරදි හා තාත්ත්වික ආදයම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වීම. |
| (ii) | රාජ්‍ය ව්‍යවසාය 11 කින් ලබා ගැනීමට ඇස්තමේන්තු කළ ලාභාංශ ආදායම ඉක්මවා සියයට 40 ක සිට සියයට 566 ක් දක්වා පරාසයක ප්‍රමාණයකින් ලාභාංශ ආදායමට දායක වි තිබුණි. | **නමුණුකුල වැවිලි සමාගම සහ ඇල්පිටිය වැවිලි සමාගම**<br><br>මෙම වැවිලි සමාගම් දෙකෙහි භාණ්ඩාගාර කොටස් හිමිකාරීත්වය සියයට 16 ක් හා සියයට 21 ක සුළු අගයක් ගෙන තිබීම නිසා ලාභ ආදායම් ඇස්තමේන්තු කර නොතිබුණි. 2020 වර්ෂය සඳහා එම සමාගම් දෙක විසින් පිළිවෙලින් රු.මිලියන 32 ක් හා රු. මිලියන 31 ක් වාර්ෂික ලාභාංශ ලෙස භාණ්ඩාගාරයට ප්‍රේෂණය කර තිබුණි.<br><br>**ශ්‍රී ලංකා ටෙලිකොම්**<br><br>ශ්‍රී ලංකා ටෙලිකොම්හි කොටසක ඉපයීම වැඩිවීම | මු.රෙ. 85 හි සඳහන් විධිවිධාන සැලකිල්ලට ගෙන නිවැරදි හා තාත්ත්වික ආදායම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | | මත සමාගම විසින් ප්‍රකාශිත කොටසක් සඳහා වූ ලාභාංශ ප්‍රමාණය වැඩි වී තිබේ. ඒ අනුව, තථ්‍ය ලාභාංශ ආදායම ඇස්තමේන්තුගත ආදායම ඉක්මවා ඇත.<br><br>**ලංකා ලේලන්ඩ් සමාගම**<br><br>ලංකා ලේලන්ඩ් සමාගමෙහි රාජ්‍ය කොටස් හිමිකාරීත්වය ඉතා සුළු ප්‍රමාණයක් බැවින් ලාභාංශ ඇස්තමේන්තු කිරීමක් සිදු නොකරන ලදී.<br><br>**ජාතික නිවාස සංවර්ධන බැංකුව, ලංකා පොස්පේට් සමාගම, මන්තායි ලුණු සමාගම, ලංකා පොහොර සමාගම, De La Rue lanka Pvt Ltd, Lanka Industrial Estates Ltd, Ceylon Agro Industries**<br><br>ඉහත ආයතන මඟින් 2020 වර්ෂය සඳහා ප්‍රකාශ කරන ලද ලාභාංශ ඉහළ මට්ටමක පැවති බැවින් ඇස්තමේන්තුගත ආදායමට වඩා තථ්‍ය ආදායම ඉහළ අගයක් ගෙන තිබුණි. | |
| (iii) | රාජ්‍ය ව්‍යවසාය 7 කින් ලාභාංශ ආදායම් ලෙස ඇස්තමේන්තු කළ ආදායමට වඩා තථ්‍ය ලැබීමේ අඩුවීම සියයට 20 ක සිට සියයට 100 ක පරාසයක ප්‍රමාණයක් වී තිබුණි. | **කුරුණෑගල වැවිලි සමාගම සහ හලාවත වැවිලි සමාගම**<br><br>2019 වර්ෂය සඳහා කුරුණෑගල වැවිලි සමාගම විසින් ප්‍රකාශයට පත් කරන ලද රුපියල් මිලියන 15 ක ලාභාංශය | ආදායම් ඇස්තමේන්තු කිරීම මුදල් පදනම මත සිදු වන බැවින් මු.රෙ. 85 හි සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කර නිවැරදි හා තාත්ත්වික ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | | 2021 වර්ෂයේදී ප්‍රමාද වී ලබා දී ඇති අතර හලාවත වැවිලි සමාගම විසින් 2017 සහ 2019 වර්ෂයන් සඳහා රුපියල් මිලියන 10 බැගින් ප්‍රකාශයට පත් කරන ලද රුපියල් මිලියන 20 ක ලාභාංශ 2021 වර්ෂයේදී ප්‍රමාද වී ලබා දී ඇත. | |
| (iv) | 2021 වර්ෂය සඳහා රාජ්‍ය ව්‍යවසාය 04 කින් රු.මිලියන 670 ක ලාභාංශ ආදායමක් ලබා ගැනීමට ඇස්තමේන්තු කර තිබුණත්, එම රාජ්‍ය ව්‍යවසායවලින් කිසිදු ලාභාංශ ආදායමක් ලබා දී නොතිබුණි. | - එම - | - එම - |
| (v) | පහත සඳහන් රාජ්‍ය ව්‍යවසාය 07 ක් විසින් පසුගිය වර්ෂ කිහිපයකදී ලාභාංශ ආදායමට කිසිදු දායකත්වයක් ලබා දී නොතිබුණි.<br>• ලංකා පුත්‍ර සංවර්ධන බැංකුව<br>• Sri Lanka Savings Bank<br>• ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලය<br>• කහටගල ග්‍රැෆයිට් ලංකා සමාගම<br>• ලංකා සීනි සමාගම<br>• ලංකා ලොජිස්ටික් සමාගම<br>• ලංකා ත්‍රිපෝෂ සමාගම | **ගුවන් තොටුපළ හා ගුවන් සේවා ශ්‍රී ලංකා සමාගම**<br>2020 වර්ෂය දක්වා මෙම සමාගම ලාභදායී ආයතනයක් ලෙස පැවතුණු බැවින් ද එම වර්ෂවලදී ඇස්තමේන්තුගත ප්‍රේෂණ ලබාදී ඇති බැවින් ද 2021 වර්ෂය සඳහා රු.මිලියන 600ක දායකත්වයක් අපේක්ෂා කරන ලදී. එහෙත් ආයතනය අලාභදායී තත්ත්වයකට පත්වීමත්, සංචාරක කර්මාන්තයේ ප්‍රවර්ධනයට අත්‍යවශ්‍ය යටිතල පහසුකම් (බණ්ඩාරනායක අන්තර්ජාතික ගුවන් තොටුපළ - අදියර II) වැඩිදියුණු කිරීම සඳහා ආයතනයේ මුදල් | රාජ්‍ය ව්‍යවසායවලින් ලාභාංශ ආදායම් රැස්කර ගැනීමට කටයුතු කළ යුතු වීම. |

යෙදවීමට සිදුවීමත් හේතුවෙන් අපේක්ෂිත ප්‍රේෂණ ප්‍රමාණය ලබාදීමට ආයතනයට හැකියාවක් ලැබී නොමැත.

ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලය අලාභ ලබමින් සිටින ආයතනයක් වන බැවින් 2019 වර්ෂයේ සිට ලාභාංශ ලබාදී නොමැත.

ලංකා සීනි සමාගම

2022.04.04 දින පැවැති මහා සභා රැස්වීමේදී 2014, 2015, 2016, 2017 සහ 2018 යන වර්ෂවල බදු පසු ලාභයක් වාර්තා කර ඇති බැවින් මහා භාණ්ඩාගාරය වෙත ලාභාංශ ගෙවීමට කටයුතු කරන ලෙස ඉල්ලීමක් කර ඇත. ඒ අනුව ප්‍රකාශ කළ යුතු ලාභාංශ මුදල ඒ වන විට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණයක් ගෙන නොමැතිවීම හේතුවෙන් මේ දක්වා අදාළ ලාභාංශ මහා භාණ්ඩාගාරය වෙත ලබා දී නොමැති අතර භාණ්ඩාගාර නියෝජිත හරහා ප්‍රේෂණය කර ගැනීම කඩිනම් කිරීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ.

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව, Parnathan Chemicals Co Ltd

2021 වර්ෂය තුළ මෙම ආයතනවල පැවති කාරක ප්‍රාග්ධන අවශ්‍යතාවයන්

හේතුවෙන් ඇස්තමේන්තුගත ආදායමට වඩා අඩු ලාභාංශ ප්‍රමාණයක් ප්‍රේෂණය කර ගන්නා ලදී.

Colombo Commercial Fertilizer Ltd,Lanka Triposha Limited, රක්නා ආරක්ෂක ලංකා සමාගම, ලංකා පුත්‍ර සංවර්ධන බැංකුව, Sri lanka Saving Bank, කහටගල ග්‍රැපයිට් ලංකා සමාගම, ලංකා ලොජිස්ටික් සමාගම

ඉහත ආයතන වල පැවති කාරක ප්‍රාග්ධන ගැටළු සහ එම ආයතන වල අපේක්ෂිත වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වන අතිරේක මුදල් ප්‍රවාහයන් සැලකිල්ලට ගෙන පසුගිය වර්ෂය තුළ ලාභ ලබාගැනිමක් සිදු නොකරන ලදී.

## 2.2 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් | නිර්දේශය |
|---|---|---|
| පරිපූරක අයවැය ඇස්තමේන්තු වලින් රු.118,240,000 ක ප්‍රතිපාදන ලබා ගෙන තිබුණි. 2020 අංක 7 දරන විසර්ජන පනතේ හා වාර්ෂික අයවැය ඇස්තමේන්තුවල සඳහන් මාර්ගෝපදේශවලට අනුව එම ලබා ගත් ප්‍රතිපාදන අදාළ නිශ්චිත කරුණු සඳහා පමණක් උපයෝජනය කළ යුතුව තිබුණත්, එසේ ලබා ගත් ප්‍රතිපාදනවලින් රු.26,400,000 ක ප්‍රතිපාදන ඊට | පරිපූරක ඇස්තමේන්තු අංක 560 මගින් රාජ්‍ය සංවර්ධන නිර්මාණ නීතිගත සංස්ථාවේ අගෝස්තු මස වැටුප් ගෙවීම සඳහා වෙන් වූ ප්‍රතිපාදන ප්‍රමාණයෙන් රු.මිලියන 26.5 ක් කිසිදු වැයක් දරා නොතිබූ බැවින් ලංකා සතොස ආයතනය විසින් මහජන බැංකුවට ගෙවීමට තිබූ දීර්ඝ කාලීන ණය සඳහා වූ උපචිත වූ පොලිය පියවීම සඳහා එම ප්‍රතිපාදන භාවිතා කරන ලදී. | වාර්ෂික විසර්ජන පනතේ හා වාර්ෂික අයවැය ඇස්තමේන්තුවේ සඳහන් මාර්ගෝපදේශවලට අනුකූලව පරිපූරක ඇස්තමේන්තු වෙන් කිරීම් මගින් ලබා ගන්නා ප්‍රතිපාදන සම්බන්ධයෙන් කටයුතු කළ යුතු වීම. |

පටහැනිව වෙනත් වැය විෂයන්වල කාර්යයන් සඳහා මාරු කරගෙන තිබුණි.

**2.3 බැරකම් හා බැඳීම් වලට එළඹීම**

------------------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක (iii) දක්වා ඇති බැරකම් ප්‍රමාණයට අමතරව රු.274,649 ක බැරකම් හා බැඳීම් වලට එළඹ තිබුණි. | ඉදිරියේදී එවැනි වැරදි සිදු නොවීමට කටයුතු කරන බව | එළඹ තිබුණු බැරකම් සියල්ල මූල්‍ය ප්‍රකාශන වලින් හෙළිදරව් කළයුතු වීම |

**2.4 නීති, රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම**

----------------------------------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ බැංකු ජංගම ගිණුම යටතේ නිකුත් කළ නමුත් බැංකුවට ඉදිරිපත් නොවූ එකතුව රු.18,493 ක් වටිනා චෙක්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396(ඇ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මු.රෙ.396(ඇ) ප්‍රකාරව අවශ්‍ය කටයුතු සිදු කිරීමට සටහන් කර ගත් බව දන්වා සිටිමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

----------------------------

**3.1 කාර්යසාධනය**

------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) “මහජන අභිලාෂයන් ආරක්ෂා කිරීම” යන ප්‍රධාන කාර්ය යටතේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ යටතේ පවතින ආයතනවල වාර්ෂික වාර්තා නියමිත දිනවල පාර්ලිමේන්තුවේ සභාගත කිරිම පිළිබඳ පරීක්ෂා කිරීමේ | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ විෂය පථය යටතේ මහා භාණ්ඩාගාරයේ හිමිකම් අයිතියක් සහිත (විවිධ හිමිකම් ප්‍රතිශතය යටතේ ) ආයතන 300ක පමණ ප්‍රමාණයක් පැවතියද ඒ අතර ඇති සුළු කොටස් හිමිකාරිත්වයක් පවතින ආයතන (Minority shareholding), උප සමාගම් (Subsidiary Companies), | දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් ඉටු කිරීම සම්බන්ධ විධිමත් සැලසුම් සකස් කර ක්‍රියාත්මක කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | කාර්යභාරය පැවැරී තිබුණි. දෙපාර්තමේන්තුව යටතේ අධීක්ෂණයට ලක්වන රාජ්‍ය ව්‍යවසාය 300 කින් ව්‍යවසාය 119 ක වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීම පිළිබඳ තොරතුරු පමණක් විගණනයට ඉදිරිපත් කර තිබුණි. රාජ්‍ය ව්‍යවසාය 181 ක් හෙවත් අධීක්ෂණයට ලක් වන මුළු රාජ්‍ය ව්‍යවසායවලින් සියයට 60 ක තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. ඉදිරිපත් කළ තොරතුරු අනුව, 2020 වර්ෂයට අදාලව රාජ්‍ය ව්‍යවසාය 11 ක මුල්‍ය ප්‍රකාශන පාර්ලිමේන්තුවේ සභාගත කිරීම සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | ආශ්‍රිත සමාගම් (Associate Companies),ප්‍රාදේශීය වැවිලි සමාගම් ඇතුළු ඇතැම් ආයතන විසින් වාර්ෂික වාර්තා සෘජුව පාර්ලිමේන්තු සභාගත කිරීමක් සිදු කරනු නොලබයි. ඒ අනුව වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත ආයතන රජයට අයත් සමාගම් 130 ක පමණ ප්‍රමාණයක් වේ.<br><br>2021 වර්ෂයේ හඳුන්වාදෙන ලද Guidelines on Corporate governance for State owned Enterprises මාර්ගෝපදේශයේ ඡේද අංක 3.2 ට අනුව වාර්ෂික කාර්ය සාධන ඇගයීම් රැස්වීමේදී, (Annual performance review meeting) වාර්ෂික වාර්තා ඉදිරිපත් කළ යුතු අතර ඒ අනුව වර්ෂය අවසන් වී මාස 05 ක කාලයක් ඇතුළත වාර්ෂික වාර්තා ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාවය සම්පූර්ණ කිරීම සඳහා ක්‍රමවේදයක් ස්ථාපිත කර ඇති බැවින් ඉදිරියේදී මෙම ගැටළු නිවැරදි කිරීමට අවශ්‍ය පියවර ගෙන තිබේ. | |
| (ආ) | ආරම්භක වශයෙන් ලංකා විදුලිබල මණ්ඩලය, ලංකා ඛණිජතෙල් නීතිගත සංස්ථාව, සමූපකාර තොග වෙළඳ සංස්ථාව, ජාතික ජලසම්පාදන හා ජලාප්‍රවාහන මණ්ඩලය, ශ්‍රී ලංකා වරාය අධිකාරිය, ශ්‍රී ලංකා රාජ්‍ය ඔෟෂධ නීතිගත සංස්ථාව සහ රාජ්‍ය දැව සංස්ථාව යන රාජ්‍ය ව්‍යවාසය 07 ක් සහ ලංකා බැංකුව, මහජන බැංකුව, ජාතික ඉතිරිකිරීමේ බැංකුව, රාජ්‍ය උකස් සහ ආයෝජන බැංකුව, ශ්‍රී ලංකා විනිමය සුරැකුම්පත් කොමිෂන් සභාව සහ ශ්‍රී ලංකා ආයෝජන | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් 2021 නොවැම්බර් 16 දිනැතිව නිකුත් කරන ලද රාජ්‍ය ව්‍යාපාර සඳහා වූ මෙහෙයුම් අත්පොත හා මාර්ගෝපදේශ සංග්‍රහයෙහි උප සමාගම් අධීක්ෂණය කිරීම සම්බන්ධයෙන් මෙම දෙපාර්තමේන්තුව සෘජුව මැදිහත් නොවන අතර, එම ආයතනයන් සෘජු අධීක්ෂණය කිරීම හා ඒවායේ වගකීම රේඛීය අමාත්‍යාංශයේද මඟපෙන්වීම මත මව් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය සතු වේ.<br><br>රාජ්‍ය බැංකු අනෙකුත් පෞද්ගලික අංශයේ බැංකු ආයතන අදාල නෛතික ප්‍රතිපාදන ප්‍රකාරව ශ්‍රී ලංකා මහ බැංකුවේ නියාමනයට හා සෘජු අධීක්ෂණයට යටත්වේ. කෙසේ | දෙපාර්තමේන්තුව නැවත ප්‍රතිස්ථාපනය කිරීමේ අරමුණු සාක්ෂාත් කර ගැනීමට කටයුතු කළ යුතු වීම |

මණ්ඩලය වෙනුවෙන් ව්‍යවස්ථාපිත ආයතන පාලනය කිරීම පිළිබඳ හොඳම ක්‍රියා පිළිවෙත ක්‍රියාත්මක කිරීම හා ඉන් අනතුරුව, එම පිළිවෙත සෙසු ආයතන සඳහා ක්‍රියාත්මක කිරීමේ මූලික අරමුණෙන් 2002 වර්ෂයේදී රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව නැවත ප්‍රතිස්ථාපනය කර තිබුණි.

විගණනයට ඉදිරිපත් කරන ලද ශ්‍රී ලංකා මහ බැංකුව, ලංකා බැංකුව, ජාතික ඉතිරිකිරීමේ බැංකුව සහ මහජන බැංකුවේ අධීක්ෂණ ලිපිගොනු තුළ සේවය අවසන් කරන ලද අනියම් කොන්ත්‍රාත් හෝ නුපුහුණු සේවකයන් නැවත සේවයේ පිහිටුවන ලෙස කරන ලද ඉල්ලීම්, නව බැංකු ශාඛා ඇති කරන ලෙස කරන ලද ඉල්ලීම්, නව ATM යන්ත්‍ර ස්ථාපිත කරන ලෙස කරන ලද ඉල්ලීම්, පාරිභෝගිකයන්ගේ පැමිණිලි වැනි කරුණු අන්තර්ගත වී තිබුණි. එම අන්තර්ගත කරුණු පිළිබඳව රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව ප්‍රමාණවත් මැදිහත්වීමක් සිදුකර නොතිබුණු අතර අදාල ඉල්ලීම් ආයතනය වෙත යොමු කිරීම පමණක් සිදු කර තිබුණි. ඒ පිළිබඳව පසු විපරම් කිරීමක්ද සිදු කර නොතිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව නැවත ප්‍රතිස්ථාපනය කිරීමේ අරමුණ ඉටු වී නොතිබුණි. වෙතත් රාජ්‍ය බැංකුවල හිමිකාරීත්වය දරන මහා භාණ්ඩාගාරය, බැංකුවට අදාල අණපනත් මඟින් සිදුකළ යුතු අනුමැතින් ලබාදීම් හා අදාල වෙනත් කටයුතු සඳහා අවශ්‍ය මැදිහත්වීම කරනු ලැබේ.

| | | | |
|---|---|---|---|
| (ඇ) | රජය සතුව පැවති පූගොඩ ටෙක්ස්ටයිල්ස් ලංකා ලිමිටඩ් ආයතනය 2010 වර්ෂයේදි වසා දැමීමත් සමඟ එම සමාගම සතුව පැවති අංක 223-227, ප්‍රධාන වීදිය, කොළඹ 11 ස්ථානයේ පිහිටි පර්චස් 14 – 95 ගොඩනැගිල්ල සහිත ඉඩම මහා භාණ්ඩාගාරය සතු වත්කමක් ලෙස පැවැතුණි. පූගොඩ ටෙක්ස්ටයිල්ස් සමාගම වසා දමන අවස්ථාවේ මෙම ගොඩනැගිල්ල රමෝනා පුද්ගලික සමාගම වෙත වර්ෂ 2 ක් සඳහා බදු ලබාදී තිබුණි. එම බදු කාලය අවසන් වීමත් සමඟ මුදල් අමාත්‍යාංශය විසින් මෙම ගොඩනැගිල්ල පැවති බදුකරු වෙත කෙටි කාලීනව අවස්ථා කීපයකදී බදු ලබාදී තිබුණි. මෙම ගොඩනැගිල්ල භාවිතයට නුසුදුසු තත්ත්වයේ පවතින අතර එය කඩා ඉවත් කර නව ගොඩනැගිල්ලක් ඉදිකිරීම අවශ්‍ය වන බවත්, ඒ සඳහා රු.මිලියන 120 ක් පමණ වැය කළයුතු බවට බදුකරු විසින් මුදල් අමාත්‍යාංශය වෙත දැනුම් දී තිබුණි. මේ අනුව රජයේ ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව පදනම් කර ගනිමින් මෙම දේපල වසර 15 ක කාලයක් සඳහා දීර්ඝකාලීන බදු පදනමින් රමෝනා (පුද්) සමාගම වෙත බදු දීමට අනුමැතිය ලබාගැනීම සඳහා අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කිරීමට තීරණය කර ඇති බව ලිපි ගොනුව අනුව | ඉඩම් කොමසාරිස් ජනරාල් විසින් අංක L2/SLO/COL/CoL/051 හා 2021.09.24 දිනැතිව ඔහුගේ නිරීක්ෂණ ලබා දී ඇති අතර, අදාල දේපල වසර 15 ක කාලයක් සඳහා දීර්ඝකාලීන බදු පදනමින් ලබා දීම සඳහා අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් සකස් කර ඇමති කාර්යාලය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු සූදානම් කර ඇත. | රජය සතු වත්කම් වෙනත් පාර්ශව යටතේ උපයෝජනය කිරීමේ කටයුතු විධිමත්ව සිදු කළ යුතු අතර, එහි ප්‍රගතිය සමාලෝචනය කර රජයට ලබාගත හැකි ආදායම් ලබා ගැනීමට කාර්යක්ෂමව කටයුතු කළ යුතු වීම |

| | | | |
|---|---|---|---|
| | නිරීක්ෂණය විය. නමුත් මෙම කරුණ සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සඳහා දෙපාර්තමේන්තුවේ ප්‍රමාණවත් මැදිහත් වීමක් සිදු වී නොතිබුණි. | | |
| (ඇ) | දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයක් ලෙස රාජ්‍ය ව්‍යාපාර අධීක්ෂණය හා පාලනය ඇතුළත් වේ. මහා භාණ්ඩාගාරය විසින් බෝහෝ රාජ්‍ය ව්‍යාපාරවල අධ්‍යක්ෂ මණ්ඩලය නියෝජනය කිරීම සඳහා නියෝජිතයෙකු පත්කර තිබුණද, 2020 වර්ෂයේ රාජ්‍ය ව්‍යවසායන් 19 කට අදාලව නිකුත් කරන ලද විගණන වාර්තාවල ඇතුළත් නීතිරීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම් 105 ක් අනාවරණය කර තිබුණි. එම නිති, රීති හා රෙගුලාසි ආදියට අනුකුලවන ලෙස කටයුතු කිරීමට රාජ්‍ය ව්‍යවසායන් පෙළඹවීම භාණ්ඩාගාර නියෝජිතයා මගින් සිදු කර ගැනීමට අපොහොසත් වී තිබුණි. | රාජ්‍ය ව්‍යාපාර වල මෙහෙයුම් ක්‍රියාකාරකම් ශක්තිමත් කිරීම තුළින් යහපාලනය වැඩිදියුණු කිරීමේ අරමුණින් 2021 නොවැම්බර් 16 දිනැති රාජ්‍ය ව්‍යාපාර සඳහා වූ මෙහෙයුම් අත්පොත හා මාර්ගෝපදේශ සංග්‍රහය නිකුත් කර ඇත. තවද රාජ්‍ය ව්‍යාපාරවල කාර්යසාධනය අධීක්ෂණය කිරීමේ අරමුණින් ඔවුන්ගේ සංයුක්ත සැලසුම්, ක්‍රියාකාරී සැලසුම් නිවැරදි කිරීම් සඳහා යෝජනා ලබාදීමද, අප දෙපාර්තමේන්තුව විසින් සිදු කර ඇති අතර භාණ්ඩාගාර නියෝජිතයන් සඳහා රාජ්‍ය ව්‍යාපාරවල අධ්‍යක්ෂ මණ්ඩලය නියෝජනය කිරීමේදී කටයුතු කළ යුතු ආකාරය පිළිබඳව පුහුණු සැසි තුළින් ඔවුන්ව දැනුවත් කිරීමට කටයුතු කර ඇත. | රාජ්‍ය ව්‍යවසායන් රජයේ නීතිරීති වලට අනුකූලව කටයුතු කිරීම පිළිබඳව නිවැරදිව අධීක්ෂණය කළයුතු වීම |
| (ඉ) | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධීක්ෂණයට ලක් වන ආයතන 300 ක් අතරින් ආයතන 119 ක් රාජ්‍ය ව්‍යාපාර සතු උප සමාගම් වන අතර මෙම උපසමාගම් දෙපාර්තමේන්තුවේ ඍජු අධීක්ෂණයට ලක් නොවන බව නිරීක්ෂණය විය. | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේනතුව විසින් 2021 නොවැම්බර් 06 දිනැතිව නිකුත් කරන ලද රාජ්‍ය ව්‍යාපාර සඳහා වූ මෙහෙයුම් අත් පොත හා මාර්ගෝපදේශ සංග්‍රහයේ උපසමාගම් අධීක්ෂණය කිරීම සම්බන්ධයෙන් මෙම දෙපාර්තමේන්තුව ඍජුව මැදිහත් නොවන අතර, එම ආයතනයන් ඍජු අධීක්ෂණය කිරීම හා ඒවායේ වගකීම රේඛීය අමාත්‍යාංශයේද මඟ පෙන්වීම මත මව් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය සතු වේ. | නිවැරදි මඟපෙන්වීම් හා උපදෙස් ලබාදෙමින් රාජ්‍ය ව්‍යාපාරවල කාර්යසාධන මට්ටම ඉහළ නැංවීම. |

## 4. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ පැවති පුරප්පාඩු 11 තුළ ජ්‍යෝෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 06 ක් පැවතුණි. | කාර්ය මණ්ඩල පුරප්පාඩු සම්පූර්ණ කරන ලෙස මුදල් අමාත්‍යාංශය වෙත වරින් වර ඉල්ලීම් ඉදිරිපත් කර ඇත. | දෙපාර්තමේන්තුවේ කාර්යභාරය ඉටුකිරීමට අවශ්‍ය තනතුරු පුරප්පාඩු පවතින්නේ නම් එම තනතුරු පිරවීම පිළිබඳව කටයුතු කළ යුතු වීම සහ අනුමත කාර්යමණ්ඩලය තුළ දෙපාර්තමේන්තුවට අනවශ්‍ය තනතුරු තිබේනම් ඒවා සංශෝධනය කිරීමට කටයුතු කළ යුතු වීම |